ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

වාර්ෂික කාර්යසාධන වාර්තාව
2022

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව , තැ.පෙ.14, පේරාදෙණිය
தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம் ,த.பெ.14, பேராதனை.
Department of National Botanic Gardens,P.O.Box.14,Peradeniya

පටුන

01. පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 03

02. පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 20

03. පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 21

04. පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 26

05. පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 27

06. පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 29

07. පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 33

08. උද්භිද උද්‍යාන භාර අරමුදල - වාර්ෂික කාර්ය සාධනය 41

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරෝගාමී ආයතනය වේ. ශාක විතැන් සංරක්ෂණය සහ ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු,උද්‍යාන අලංකරණ පිළිබඳ විද්‍යාත්මක කටයුතු ප්‍රවර්ධනය සඳහා වන පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා හඳුන්වා දීම, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විශාල දායකත්වයක් ලබාදෙන අතර ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනය දිනාගත් ස්ථානයන් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යානයන් වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතරව මෑතකාලයේදී පිළිවෙළින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට පිහිටි මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ලෙහි පිහිටි සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුළ ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුළින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් මෙම සංරක්ෂිත ශාක අතරට ඇතුළත් ය. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනයකිරීම පිණිස දායක වන පුරෝගාමී ආයතනය වේ.

උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යබව තහවුරු කිරීමේ කාර්යයන් කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය විසින් මල්වගා පර්යේෂණ කටයුතු සහ විවිධ මල්වගා සංවර්ධන වැඩසටහන් සිදුකරමින් ඒ හරහා රට තුල මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධන කටයුතු සිදුකෙරේ. කෙටිකාලීන පුහුණු පාඨමාලා,එක්අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ඔවුන් සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුළින් සිදුවන මහඟු කාර්යයකි.

1.2 . ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුළ ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය, අගය කිරීම තුළින් ශාක සම්පත ජනතාවට සමීප කරවීම.

අරමුණු

- ශ්‍රී ලංකාවේ මල්වගාව කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ යටිතල පහසුකම් සැපයීම.
- ශාක සම්පත් විද්‍යාත්මකව නිවැරදිව සත්‍යාපනය කිරීම තුළින් නෛතික මෙන්ම ශාක ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය සහය ලබාදීම.
- තිරසර සංචාරක සංවර්ධනය හා ප්‍රවර්ධනය තුළින් දේශීය ආර්ථික සහ සමාජ සංවර්ධනයට සෘජුව දායක වීම.
- ශ්‍රී ලංකාවේ ශාක සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය සම්බන්ධව අනාගත පරපුර දැන්වත් කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා විතැන් සංරක්ෂණ ක්‍රමවේද සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව සහ ශාක සම්පත් හා බැඳී පවත්නා වූ විවිධ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරැදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ මල්වගා කටයුතු සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
- සුදුසු ස්ථාන වල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.
- අලංකරණ උද්‍යාන විද්‍යාත්මක කටයුතු ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණික වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂ ලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- අනුරාධපුර ජය ශ්‍රී මහබෝධීන් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම

1.4 සංවිධාන සටහන



** රා.උ.උ. - රාජකිය උද්භිද උද්‍යානය

ස.අ. කාර්යාලය - සහකාර අධ්‍යක්ෂ කාර්යාලය

තෙ.ක.උ.උ. - තෙත් කලාපිය උද්භිද උද්‍යානය

වියළි ක.උ.උ.- වියළි කලාපිය උද්භිද උද්‍යානය

1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සහ ඒකක

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

1821 දී ස්ථාපිත පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙමින් ශාක පිළිබඳ අධ්‍යයනයන්ට හා සංරක්ෂණ කටයුතු සඳහා දායකත්වයක් ලබා දෙයි.

හෙක්ටයාර 61.25ක් වූ උද්‍යානය මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති අතර, ශාක පිළිබඳ අධ්‍යයනයන්ට, උද්භිද හා පරිසර විද්‍යාත්මක පර්යේෂණයන්ට, විවිධ වටිනා, ඓතිහාසික වටිනාකමක් ඇති වඳවී ගොස් ඇති, තර්ජනයට ලක් වී ඇති ශාක ප්‍රදර්ශනයට මෙන්ම මහජනතාවට විනෝදාස්වාදය ලබා දීමට ද දායක වන ස්ථානයක් ලෙස ප්‍රචලිත ය.

ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක්රැස් කර ඇති ස්ථානයකි. වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක 160,000 ආසන්න ප්‍රමාණයක් යෝග්‍ය තත්ත්වයන් යටතේ ක්‍රමානුකූල අධ්‍යයනය සහ විමර්ශන කාර්යයන් සඳහා සංරක්ෂණය කරමින් තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේ තැන්පත් කර ඇත.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක, ශාක වර්ගීකරණ පර්යේෂණ සඳහා මෙන්ම ඵෙව විවිධත්ව අධ්‍යයන කටයුතු සඳහා දත්ත බැංකුවක් ලෙසද ශාක හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා යොදා ගනී.

හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දී ආරම්භ කරන ලද අතර උද්‍යානයට අයත් බොහෝ ශාක සෞම්‍ය කලාපීය ශාක වේ. මෙම ශාක එකතුව ශ්‍රී ලංකාවට ආවේණික ශාකවල මෙන්ම වෙනත් රටවලින් හඳුන්වා දුන් කඳුකර හා ඒ ආශ්‍රිත ශාක වල එකතුවකි. මේවා උද්‍යානයේ විවිධ අංශවල ක්‍රමානුකූලව සිටුවා ඇත.

ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, වපසරිය හෙක්ටයාර 17.4 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල ශාක විශේෂයන් 2000 ක පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය, පේරාදෙණිය

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන අංශය, මල්වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කැපවී සිටී.

ශ්‍රී ලංකාවේ මල් වගාකරුවන් දිරිමත් හා සවිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍රයේ උපදේශන සේවා හා ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු, උපකරණ සහ තත්ත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා මෙම ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. උද්‍යානය හෙක්ටයාර 21.04 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි විශාල ප්‍රමාණයක් උද්‍යානය තුළ දැකිය හැක . ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පහසුවෙන් සොයා ගත නොහැකි දුර්ලභ ඖෂධීය පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි ක්‍රමවත්ව වගා කිරීම සහ පැළෑටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙහි නිරත වී සිටියි.

මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

දේශීය විශේෂඥයින් විසින් අවුරුදු 130 කට පසු සැළසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර එහි සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2013 වර්ෂයේ දී මහජනතාවට විවෘත කරන ලදී .
වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට දායක වීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය

අවිස්සාවේල්ල ප්‍රදේශයට ආසන්නව මෙම උද්‍යානය පිහිටා ඇති අතර, සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලද අතර 2015 දී මහජනතාවට විවෘත කරන ලදී. උද්භිද උද්‍යානය හෙක්ටයාර 42.49 වපසරියකින් යුක්ත ය.
පහතරට තෙත් කලාපීය ශාක විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත. විවිධ ශාක විශේෂවල ආර්ථික, සෞන්දර්යාත්මක සහ පරිසර විද්‍යාත්මක ලක්ෂණ විදහා දක්වමින් පුද්ගලයන් සඳහා විනෝදාස්වාදය ගෙන දෙන ආකර්ශනීය ස්ථානයක් ලෙස මෙම උද්‍යානය එහි කාර්යයන් සිදු කරනු ලබයි.

සහකාර අධ්‍යක්ෂ කාර්යාලය , නාරාහේන්පිට.

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි මල්වගා කරුවන්ගේ ‘‘සුවහස් මල්’’ සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැලසීම නාරාහේන්පිට පිහිටි ‘‘සුවහස්මල් ’’ඒකකයෙන් සිදු කරනු ලබයි.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස බද උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුර පිහිටි නිල නිවාස උද්‍යානයන් සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිලනිවාසබද උද්‍යානයන්හි නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශවල පවත්වා ගෙන යන අතර දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි.

හරිත පියස පුහුණු මධ්‍යස්ථානය, මීගලෑව

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය දැනට සංවර්ධනය වෙමින් පවතී. මල් වගාව පිළිබඳව පාඨමාලා පවත්වාගෙන යන අතර ශාක ප්‍රචාරණය සිදුකරන මධ්‍යස්ථානයක් ලෙස ද කටයුතු කරනු ඇත.

1.6 මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය 2022 (ප්‍රාග්ධන වෙන්කිරීම් යටෙත් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්)

රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

- රාජකීය උද්භිද උද්‍යානයේ දෙසියවර්ෂ පූර්ණ වැඩසටහනට සමගාමීව දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය ඒළි දැක්වීම් කටයුතු සිදුකරන ලදී.මීට අමතරව දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වය උදෙසා අපරිමිත කැපකිරීම් සිදු කරන ලද දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද නිළධාරීන්ට හා සේවකයින්ටත්, වර්තමානයේ සේවය කරනු ලබන නිළධාරී හා සේවක මහත්ම මහත්මීන් දිරි ගැන්වීම් සඳහාත් උපහාර උළෙලක් පවත්වන ලද අතර ඒහිදී සමරුඵලක ප්‍රධානයක්ද සිදුකරන ලදී.



ශාකාගාරය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම

- රාජකීය උද්භිද උද්‍යානයේ දෙසිය වර්ෂපූර්ණ වැඩසටහනට (Botanic garden GALA) සමගාමීව ක්‍රියාකාරකම් සමූහයක් මෙම වර්ෂය තුලදී සිදු කරන ලදී. එහිදී විශේෂයෙන්ම මල්වගාකරුවන් දිරිගැන්වීම සඳහාත් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීමත් අරමුණු කර ගනිමින් මල්වගා ප්‍රදර්ශන පවත්වන ලදී. ශාකාගාරය මගින් ශාක විවිධත්වය හා ජෛව විවිධත්වයේ වැදගත්කම පිළිබඳව පාසල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් පවත්වන ලදී. තවද බිඟු සංරක්ෂණය හා ප්‍රජාවගේ පැවැත්මට ඔවුන්ගේ දායකත්වයේ ඇති වැදගත්කම පිළිබඳව පාසල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් සිදුකරන ලදී.



දෙසියවර්ෂ පූර්ණ නිමිත්තෙන් එළිදක්වන ලද මුල්දින කවරය සහ සමරු මුද්දර

- උද්‍යානය තුළ ඇති දෙනිකව මහජනතාවට නැරඹීමට නොහැකි පැල ගෘහයන්



බිඟු උයන පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම

මහජනතාවට නැරඹීම සඳහා අවස්ථාව ලබාදුන් අතර ඒ තුලින් වනෝද්‍යාන පැල තවාන්, ඕකිඩ් පැල ගෘහයන්, විසිතුරු පැල ගෘහ, ඇන්තූරියම් පැල ගෘහ ආදී පැල තවාන් තුල සිදුකරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට ඔවුන්ට අවස්ථාව ලබදෙන ලදී. පාසල් සිසුන් සඳහා ස්වභාවික පරිසරයත්,රාජකීය උද්භිද උද්‍යානයත් හා සබැඳි විවිධ තේමා ඔස්සේ චිත්‍ර නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදුන් අතර ඔවුන්ගේ නිර්මාණ හරහා චිත්‍ර ප්‍රදර්ශනයක් පවත්වන ලදී.





උද්‍යානය ඉදිරිපස ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කරන ලද සිහිවටන හා සමරු කිළිණ අලෙවිසැල

- තවද දෙසියවස් සැමරුම මූලික කර ගනිමින් විවිධ ආයතන සම්බන්ධ කර ගනිමින් විවිධ ආහාර සංස්කෘතීන් නියෝජනය කරන ආහාර ප්‍රදර්ශනයක් මෙම දෙසියවස් වැඩසටහනට සමගාමීව පැවැත්වූ අතර ශාක ආශ්‍රිතව මිනිසාට පරිභෝජනය කලහැකි ආහාර හා වෙනත් ශාක ආශ්‍රිත (Ethno Botany)නිෂ්පාදන සම්බන්ධවද ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකරන ලදී.
- රාජකීය උද්භිද උද්‍යානයේ දෙසියවස් සැමරුම අලලා තැපැල් දෙපාර්තමේන්තුව හා ඒක්ව සමරු මුද්දර තුනක් හා මුල්දින කවරයක් ඒලිදැක්වීමේ කටයුතුද මෙම වසරේදී සිදුකරන ලදී.
- රාජකීය උද්භිද උද්‍යාන ඉතිහාසය, විකාශනය, ශාක විවිධත්වය හා වෙනත් උද්භිද උද්‍යාන සම්බන්ධ කොරතුරු අලලා පුවත්පත් ලිපි ප්‍රකාශයට පත්කරන ලද අතර ඒම තොරතුරු සම්බන්ධව ගුවන්විදුලි වැඩසටහන්ද සිදුකරනසිදුකරන ලදි.



නවීකරණය කරන ලද ගිමිහාන කුටි

- කාර්යක්ෂම මූල්‍ය ගණුදෙනු සඳහා අමුත්තන්ට පහසුකම් සැලසීමේ අරමුණින් ස්ථාපිත කරන ලද ලංකා බැංකු ගොඩනැගිල්ලෙහි වැඩිදියුණු කිරීම් කටයුතු ද නිම කරන ලදී. එම ගොඩනැගිල්ලෙහි උද්‍යාන සැමරුම් හා සිහිවටන විකිණුම් හලක් දැනට පවත්වාගෙන යනු ලබයි.
- උද්‍යානයේ ආකර්ෂණය සහ පිළිවෙළ වැඩිදියුණු කිරීම සඳහා උද්‍යානයේ භූමි සංවර්ධන කටයුතු ලෙස මාර්ග අලුත්වැඩියා



වැඩ නිමකරන ලද ෆෙරෝසිමෙන්ට් ටැංකිය

කිරීම්, ජල හා ජලපවාහන පද්ධති වැඩිදියුණු කිරීම් ද බෝක්කු පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම් කටයුතුද සිදු කරන ලදී.



නිමවෙමින් පවතින ළමා අධ්‍යාපන ප්‍රදේශය

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 101,468 ක පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.
- උද්‍යානවල විකාශනය, උද්‍යාන පිළිබඳ ඉතිහාසය හා උරුමය පිළිඹිඹු කිරීමේ අරමුණින් ස්ථාපිත කරන ලද කෞතුකාගාරයේ ඇතුලත නිර්මාණ කටයුතු ආරම්භ කරන ලද අතර එහි පිවිසුම් මාර්ගයේ සංවර්ධන කටයුතු මෙන්ම ඇතුලත නවීකරණ කටයුතු සිදුකරන ලදී. නමුත් රටතුළ පැවැති ආර්ථික අස්ථාවරත්වය මත අමුද්‍රව්‍ය මිළ ඉහළ යාම්, ඉන්ධන අර්බුද හමුවේ එහි කටයුතු සියල්ල මෙම වර්ෂයේදී නිම කර ගැනීමට නොහැකි විය.



පැල ගෘහයේ කටයුතු වැඩිදියුණු කිරීම් සිදුකිරීම්

- උද්‍යානය තුළ ජල සම්පාදනය යාවත්කාලීන කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද ෆෙරෝසිමෙන්ට් ටැංකියෙහි ඉදිකිරීම් කටයුතු මේ වනවිට අවසන් කර ඇත.
- කාර්යාල කටයුතු හා උද්‍යාන නඩත්තු කිරීම්වල කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද කාර්යාල රථගාල සහ කාර්යාලය ඉදිකිරීම් කටයුතු සඳහා වෙළඳපොළෙහි පැවති භාණ්ඩ හිගය හා අමුද්‍රව්‍ය මිළ ඉහළයෑම් එම කටයුතු 40% ක් පමණ නිම කරන ලදුව එම කාර්යය නවතා දමන ලදී. උද්‍යානයට පැමිණෙන නරඹන්නන්ගේ පොදු පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ස්ථාපිත කරන ලද ත්වේටිස් ගිම්හාන කුටිය, වනෝද්‍යානය අසල ගිම්හාන කුටිය, අලුත්වත්ත අසල ගිම්හාන කුටිය සහ විසිතුරු ශාක තවාන අසල ගිම්හාන කුටි ද ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් කරන ලදී.
- උද්‍යානයේ ශාක එකතුන් උසස් තත්ත්වයෙන් නඩත්තු කිරීම සඳහා ඉදිකරන ලද පැල බඳුන්ගත කිරීමේ ගෘහයෙහි වැඩ කටයුතු ද මෙම වසරේදී අවසන් කරන ලදී.
- උද්‍යානවල සේවය කරනු ලබන නිළධාරීන්ගේ සේවා තෘප්තිය වැඩිදියුණු කිරීම සඳහා නිල නිවාස 02 ක අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරන ලදී. ප්‍රධාන බෝඩරය අසල සේවක විවේකාගාරයට නව කාමරයක් එකතු කිරීමේ කටයුතුද සිදුකරන ලදී.
- උද්‍යානයේ සේවය කරනු ලබන නිළධාරීන්ගේ සහ සේවකයින්ගේ සේවා තෘප්තිය වැඩිදියුණු කිරීමටත් සේවා ඵලදායීතාව උපරිම ලෙස ලබාගැනීමේ අරමුණින් ආරම්භ කරන ලද කාර්යාල

රථගාලෙහි කටයුතු ආරම්භ කල අතර රටතුළ පැවැති ආර්ථික අස්ථාවරත්වය මත අමුද්‍රව්‍ය මිළ ඉහළ යාම්, ඉන්ධන අර්බුධ හමුවේ එහි කටයුතු සියල්ල නිම කර ගැනීමට නොහැකි වන ලදී.

- මීට අමතරව නරඹන්නන්ගේ තෘප්තිය සහ පැමිණීම වැඩිදියුණු කිරීමත් උද්‍යානයේ ආදායම ඉහළ නැංවීමත් අරමුණු කර ගනිමින් පානීය ජල කරාම වැඩිදියුණු කිරීම, කසල කාණු පද්ධතිය පිළිසකර කිරීම, මාර්ග ප්‍රතිස්ථාපනය හා අළුත්වැඩියා කිරීම්, වැසිකිළි පද්ධති නවීකරණය කිරීම්, ආදී උද්‍යානය තුළ සෙසු වැඩිදියුණු කිරීම් කටයුතුද මෙම වර්ෂයේදී සිදුකරන ලදී.

හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය - ගම්පහ

උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම වසරේදී ද සංවර්ධන වැඩසටහන් රාශියක් සිදු කරන ලදී.

- උද්‍යානයේ ආදායම තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානය නැරඹීමට පැමිණෙන නරඹන්නන්හට පැල මිලදී ගැනීම සඳහා පැල අලෙවි සැලක් ස්ථාපිත කරන ලද අතර එහි වැඩ කටයුතු මේ වසරේදී නිම කරන ලදී.
- උද්භිද උද්‍යානයෙහි ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු, උද්‍යාන අලංකරණ කටයුතු ද සිදු කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 36,591 ක පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.
- පසුගිය වර්ෂයේ ආරම්භ කරන ලද වැසිකිළි පද්ධතියේවැඩකටයුතු මෙම වසරේදී අවසන් කරන ලදී.



ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකිරීම්



ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකිරීම්

හක්ගල උද්භිද උද්‍යානය

උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම වසරේදී ද සංවර්ධන වැඩසටහන් රාශියක් සිදු කරන ලදී.

- පාංශු බාදනය අවම කිරීම සඳහා උද්භිද උද්‍යානයෙහි රැඳවුම් තාප්ප ඉදිකිරීමේ කටයුතු සිදුකල අතර උද්‍යානයේ තවාන් ප්‍රදේශ යාවත්කාලීන කිරීම් කටයුතුද සිදුකරන ලදී.
- උද්‍යානයේ මාර්ග සංවර්ධන කටයුතු සිදුකරන ලද අතර එහි නඩත්තු කටයුතු සිදුකරන ලදී.
- උද්‍යානයේ සංවර්ධන අධීක්ෂණ කටයුතු සඳහා පැමිණෙන උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු නිළධාරීන්ට සහ රාජ්‍ය නිළධාරීන්ට පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද සංචාරක බංගලා

වෙහි නවීකරණ කටයුතු මෙම වසරේදී අවසන් කරන ලදී.

- කාර්ය මණ්ඩලයේ සේවා තෘප්තිය වැඩිදියුණු කිරීමත් පහසුකම් සංවර්ධනය කිරීමත් අරමුණු කර ගනිමින් ආරම්භ කරන ලද නිල නිවාසවල අළුත්වැඩියා කිරීම් කටයුතු ද මේ වන විට අවසන් කර ඇත.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 195,829 ක පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ පහළ සහ මධ්‍ය ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් නගා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද සිදු කරන ලදී.

- දිවයින පුරා දැනට මල්වගා ව්‍යාප්තිය සඳහා ක්‍රියාත්මක වන මල්වගා ගොවි සංගම් ප්‍රමාණය 203 ක් වන අතර ඒ හරහා සාමාජිකයින් 8000 ක් ප්‍රතිලාභ ලබයි. මෙම වැඩසටහන හරහා ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බරා,කැපූ පත්‍ර වගාවන් සහ පටක රෝපණය පිළිබඳ එක් දින පුහුණු පාඨමාලා සඳහා පුද්ගලයින් 13,256ක් පුහුණු කර ඇත.
- මල්වගා සංවර්ධන හා පර්යේෂණ ඒකකය මගින් ඕකිඩ්, ඇන්තූරියම්, විසිතුරු පත්‍රික ශාක 198,813 කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

- මල්වගා කරුවන්ගේ මල්පැළ සහ ආශ්‍රිත ද්‍රව්‍ය අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු හා මහ පරිමාණ මට්ටමේ ප්‍රදර්ශන 165 ක් සහ පවත්වන ලදී. මල්වගා කරුවන්ගේ පැල තවාන් 1,052 කට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබා දෙන ලදී.



ජලජ ශාක එකතූන්

- සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 213,752 ක පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.
- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගාකරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව වාණිජමය මල්වගාව, තවාන් පාලනය, වගාවන් සම්බන්ධ පලිබෝධ සහ රෝග කළමණාකරනය ආශ්‍රිතව පැන නගින ගැටළු සම්බන්ධව පුද්ගලයින් සහ ආයතන සඳහා අය කිරීමකින් තොරව උපදේශන කටයුතු සිදු කරන ලදී.
- සියලුම උද්‍යානයන් හි මල්වගා අංශ වල පැළ තවාන් උසස් මට්ටමකින් නඩත්තු කල අතර වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු කරන ලදී. මල්වගාවන් පිළිබඳ පොත් පත්‍රිකා මුද්‍රණය සඳහා සැකසෙමින් පවතී.
- මල්වගා ක්ෂේත්‍රය හා ශාක සම්බන්ධ තොරතුරු කොළඹ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කරන ලද නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ උපදේශන කටයුතු සිදුකිරීම, පුහුණු පන්ති පැවැත්වීම වැනි මල්වගා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කරන ලදී.



ශාක ප්‍රදර්ශනාගාරයේ කටයුතු වැඩිදියුණු කිරීම් සිදුකිරීම්

- මල්වගා අංශයට අවශ්‍යම අංගයක්ව තිබූ විසිතුරු ශාක පැල ප්‍රදර්ශන ගෘහයක අවශ්‍යතාවය සපුරාලමින් පැල ගෘහයක ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද අතර දෙවර්ෂපූර්ණ වැඩසටහනට සමගාමීව මෙය මහජනතාව සඳහා විවෘත කරන ලදී. මෙම පැල ගෘහය තුළ විවිධ විසිතුරු ශාක විශේෂයන් නැරඹීමට හැකියාව ඇත.
- මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය මෙම වසරේදී ද පැවැත්වූ අතර මෙහිදී මල්වගා ක්ෂේත්‍රයේ පවතින ගැටළු පිළිබඳව මෙන්ම සංවර්ධනය උදෙසා වගා පර්යේෂණ පත්‍රිකා ද ඉදිරිපත් වූ අතර පර්යේෂණ පත්‍රිකා 14 ක ප්‍රමාණයක් එළිදැක්වුණි.

- නව දෙමුහුන් ඇන්තූරියම් ප්‍රබේද 05 ක් හඳුන්වා දුන් අතර එම ප්‍රබේද නිෂ්පාදනය කිරීම් කටයුතු ද සිදුකරන ලදී.
- විශේෂයෙන්ම නිරෝගිමත් ශාක එකතූන් නිෂ්පාදනය කර ගැනීම අරමුණු කර ගනිමින් තවාන් ප්‍රදේශ අළුත්වැඩියා කිරීම් කටයුතු සිදුකරන ලද අතර අගය එකතු කිරීම් තුලින් ශාක ප්‍රචාරණය කිරීමේ කටයුතුද සිදුකරන ලදී.

අධ්‍යාපනය සහ පුහුණුව

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන මධ්‍යස්ථානයේ නඩත්තු කිරීම් කටයුතු මේ වසරේදී ද සිදු කරන ලදී.

- තරුණයින් 176 දෙනෙකු නවීන මල් වගා ක්‍රමවේද, භූ අලංකරණ ක්‍රමවේද පිළිබඳව සිවුමාසික පාඨමාලාව හරහා පුහුණු කරන ලදී.
- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ-level 4) ලබා දෙන පාඨමාලාව සඳහා සිසුන් 34 දෙනෙකු බඳවා ගැනීම් සිදුකරන ලද අතර මල්වගා හා භූමි අලංකරණ පාඨමාලාව සඳහා නව සිසුන් 176 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරා අවසන් කර ඇත.
- තවද සේවාස්ථ පුහුණුව සඳහා (OJT)සිසුන් 136 දෙනෙකු ලියාපදිංචි වී පුහුණුව අවසන් කර ඇති අතර විශ්ව විද්‍යාල සිසුන් 06 දෙනෙකුද ජෛව පද්ධති තාක්ෂණ පුහුණුව හදාරන ලදී. තවද මෙරටුව විශ්ව විද්‍යාලයේ භූමි අලංකරණ ගෞරව උපාධිධාරී සිසුන් 15 දෙනෙකු ද සයමාසික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා අවසන් කරන ලදී.
- රෝස වගාව,තවාන් කළමනාකරණය, ශාක හඳුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්,පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 2,058 ක් පුහුණු කරන ලදී.

සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය

උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් උද්‍යානය තුළ ඇති කිරීම, නඩත්තු කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සහ උද්‍යානය තුළ නව පහසුකම් ඇති කිරීම සඳහා විවිධ සංවර්ධන කටයුතු මේ වසරේදී සිදු කරන ලදී.

- කාර්ය මණ්ඩලයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නාන කාමර සහ වැසිකිළි පද්ධති ඉදිකිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කරන ලද අතර එහි සංවර්ධන කටයුතු කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයත්, අමුද්‍රව්‍ය මිල ඉහළ යාමත් ආදී ගැටළු පැන නැගීම හේතුවෙන් අවසන් කර ගැනීමට නොහැකි විය.



වැසිකිළි පද්ධති ඉදිකිරීම් කටයුතු සිදුකිරීම්

- උද්‍යාන නඩත්තු කිරීමේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා උද්‍යාන උපකරණ මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලද අතරඉඩම් වැඩිදියුණු කිරීම් යටතේ තවාන් ප්‍රදේශ සහ ජලපවහන ප්‍රදේශ අලුත්වැඩියා කිරීම් කටයුතු ද සිදු කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 31,162 ක පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.
- රෝස වගාව,තවාන් කළමනාකරණය, ශාක හදුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්,පශ්චාත් අස්වනු තාක්ෂණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 26 දෙනෙකු පුහුණු කර ඇත.

මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය

උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩිදියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩි පාරවල්, මංමාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින්ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

- උද්‍යානයේ ජල සැපයුම් පද්ධතිය යාවත්කාලීන කිරීමේ අරමුණින් කොහොඔගස්වැව නවීකරණ කටයුතු සිදුකරන ලද අතර උද්‍යානයේ ප්‍රවර්ධනයට



ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකිරීම්

- අවශ්‍ය මාර්ගපුවරු යාවත්කාලීන කිරීමත් උද්‍යානය තුල ඇති සංඥාපුවරු අලුත්වැඩියා කිරීමත් සිදුකරන ලදී.
- ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් යටතේ වෙනත් තාක්ෂණික ක්‍රියාකාරකම් ලෙස තවාන් ප්‍රදේශ වැඩිදියුණු කිරීම්, ජලප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීම් හා යාවත්කාලීන කිරීම් කටයුතුද සිදුකරන ලදී.



ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකිරීම්

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 29,966 ක පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.
- රෝස වගාව,තවාන් කළමනාකරණය, ශාක හදුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්,පශ්චාත් අස්වනු තාක්ෂණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 475 ක් දෙනෙකු පුහුණු කරන ලදී.

ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

- උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදුකිරීම තුළින් උද්‍යානය උසස් තත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.
- උද්‍යානයට පැමිණෙන කරඔන්නන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර මෙම වර්ෂයේදී එම කටයුතුවලින් 50% ක් පමණ නිම කරන ලදී.
- උද්‍යානයේ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 28,341 කට අධික ප්‍රමාණයක් නිපදවන ලද අතර ශාක එකතූන් අලුතින් ඇතිකිරීමේ කටයුතු ඇතුළුව ශාක එකතූන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.
- ඖෂධශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 202 දෙනෙකු ඖෂධශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශණ පවත්වා දැනුවත් කරන ලදී.

මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

- ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කරන ලද අතර ඒ තුළින් පැල නඩත්තු කිරීම්, උද්‍යානය නඩත්තු කිරීම් කටයුතු සිදු කරන ලදී.
- මෙම වසරේදී ද පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර අගය එකතු කරන නිෂ්පාදන සහ ශාක එකතූන් වැඩිදියුණු කිරීම් කටයුතු ද සිදුකරන ලදී.
- විවිධ වගාවන් පුහුණු මධ්‍යස්ථාන වගා භූමියේ ස්ථාපිත කරන ලද අතර දෛනිකව සිදු කරනු ලබන සෙසු සියළු අළුත්වැඩියා කටයුතු, සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.
- උද්‍යානයේ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 14,629 කට අධික ප්‍රමාණයක් නිපදවන ලද අතර ශාක එකතූන් අලුතින් ඇතිකිරීමේ කටයුතු ඇතුළුව ශාක එකතූන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.



උද්‍යානයෙහි ජලජ ශාක එකතුව

සියලුම උද්‍යානයන් හි කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුළින් උද්‍යාන අලංකරණය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

ඉහත සඳහන් සංවර්ධන වැඩසටහන් වලට අමතරව දෙපාර්තමේන්තුව විසින් මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක, අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01, නුවර, නුවරඑළිය සහ අනුරාධපුර නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ අරලියගහ මැදුර නිල නිවාස උද්‍යානය සහ නුවරඑළිය නිල නිවාස උද්‍යානය ද අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්වය මනා ලෙස පවත්වාගෙන යාමේ කටයුතු ද සිදු කරනු ලැබීය. තවද ශ්‍රී මහා බෝධීන් වහන්සේට සුළඟින් සිදුවන හානි අවම කිරීම සඳහා පිහිඹිය, බුළු,කුඹුක්,කොහොඹ,කහ මාර, කෝන්, හැලඹ,මී, නා සහ සියඹලා ආදී ශාක වර්ග සිටුවන ලදී.

සියළුම උද්‍යානයන්හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුලින් ද නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, උද්‍යානයේ විවිධ අංශ කාර්යක්ෂමව නඩත්තු කිරීම තුලින් ද උද්‍යානයන් හි අලංකරණය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

මෙහි සඳහන් සියළු සංවර්ධන වැඩසටහන් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ප්‍රාග්ධන අරමුදල් යටතේ සිදුකරන ලද අතර උද්භිද උද්‍යාන භාර අරමුදලේ ප්‍රතිපාදන හරහා සිදු කරන ලද සංවර්ධන කටයුතු ඇමුණුම් අංක I යටතේ විස්තර කර ඇත.

1.7 නරඹන්නන්ගේ පැමිණීම

මෙම වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුලු සංචාරකයන් සංඛ්‍යාව 1,876,370 ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 1,773,048 ක් දේශීය සංචාරකයින් වන අතර 103,322 ක් විදේශීය සංචාරකයින් වේ.

1.7.1 2022 වසරේදී උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාත්මක තොරතුරු



උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය හා විදේශීය සංචාරකයින් සංඛ්‍යාවන්



2021 හා 2022 වසරවල දී උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදෙශීය සංචාරකයින්ගේ සංසන්දනාත්මක තොරතුරු

1.7.2. 2018 වර්ෂයේ සිට 2022 වසර තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

විස්තරය	වර්ෂය				
	2018	**2019**	**2020**	**2021**	**2022**
දේශීය නරඹන්නන් සංඛ්‍යාව	2,364,649	2,098,202	642,573	714,493	1,773,048
විදේශීය නරඹන්නන් සංඛ්‍යාව	463,695	331,888	93,304	18,412	103,322
එකතුව	**2,838,344**	**2,430,090**	**735,877**	**732,845**	**1,876,370**

2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ජාතික උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගෙන් ලැබුණු මුළු ආදායම

විස්තරය	වර්ෂය				
	2018	**2019**	**2020**	**2021**	**2022**
දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මී)	111.34	130.937	67.91	64.60	143.31
විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මී)	673.42	537,092	181.829	35.785	200.18
එකතුව (රු.මී)	**784.76**	**668.029**	**249.739**	**100.385**	**343.49**

1.9 මූල්‍ය ප්‍රගතිය

ප්‍රධාන උද්‍යානයන් හි සහ අනෙකුත් ඒකකවල සංවර්ධන කටයුතු සැලසුම් කළ පරිදි සිදුවන අතර 2022 වර්ෂයේ දෙසැම්බර් 30 වන විට දෙපාර්තමේන්තුවේ මූල්‍යමය ප්‍රගතිය 99% ක් විය.

2022 වර්ෂයේ වැය විස්තරය

මූල්‍ය ප්‍රභවය		ප්‍රතිපාදන (රු.මී)	වියදම (රු.)	%
ප්‍රාග්ධන වියදම	ඒකාබද්ධ අරමුදල	96.875	93.958	97
	උද්භිද උද්‍යාන භාර අරමුදල	74.225	74.225	100
එකතුව (ප්‍රාග්ධන)		**171.1**	**168.183**	**98.2**
පුනරාවර්තන		576.2	572.516	99.3
මුළු එකතුව		**747.3**	**740.699**	**99.1**

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

- උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන නරඹන්නන් සඳහා සමරු තිළිණ සහ සිහිවටන අලෙවිසැලක් ස්ථාපිත කිරීම. ඒ හරහා උද්භිද උද්‍යානවල තොරතුරු, සියළුම මල් සහ ගස් සම්බන්ධ තොරතුරු මෙන්ම සමරු තිළිණ හා සිහිවටන මිලදී ගැනීමට අවස්ථාව ලබාදීම.
- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට වසර 200 සපිරීම නිමිත්තෙන් ගරු.සංචාරක අමාත්‍යාතුමාගේ ප්‍රධානත්වයෙන් සමාරම්භක උත්සවය පැවැත්වීම.
- කොරෝනා වසංගතය හේතුවෙන් රට සම්පූර්ණයෙන්ම වසා තැබූ තත්ත්වයේ වුවද සියළුම උදභිද උද්‍යාන මනාව නඩත්තු කරගෙන පවත්වාගෙන යාමට හැකිවීම.
- කොරෝනා උවදුරෙන් පසුව නැවත රට විවෘත කර කෙටි කාලයක් තුළදී දේශීය සහ විදේශීය සංචාරකයින්ගේ පැමිණීම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්කර ගැනීමට හැකිවීම.

2.2 අභියෝග

- දේශීය සහ විදේශීය වශයෙන් සිදුවන ආරක්ෂක, ආර්ථික,දේශපාලන හා සමාජීය වශයෙන් සිදුවන බලපෑම් හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීමට සිදුවන බලපෑම.
- දේශගුණික සහ පාරිසරික සාධක වෙනස්වීම්වල බලපෑම.
- නව උද්භිද උද්‍යාන පිහිටුවීමේදී සුදුසු ඉඩම් හඳුනාගැනීම සහ පවරාගැනීමේදී ඇතිවන ගැටළු.
- අන්තර් ජාතික ප්‍රචාරණය ඉහළ නංවා ගැනීම.
- නවීන තාක්ෂණ අවස්ථා අත්පත් කර ගැනීමේදී පවතින බාධා

2.3 ඉලක්ක

- සියලුම උද්භිද උද්‍යාන අන්තර්ජාතික ප්‍රමිති තත්ත්වයන්ට අනුකූලව දකුණු ආසියාතික කලාපයේ හොඳම උද්භිද උද්‍යාන බවට පත් කිරීම.
- ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳ ජාතික දත්ත පද්ධතිය වැඩිදියුණු කර පවත්වාගෙන යාම.
- ජාතික අණුක ජීව විද්‍යා රසායනාගාරය ඉදිකිරීම.
- ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ වලින් 50% ක් 2023 වර්ෂය වන විට උද්භිද උද්‍යාන තුල විතැන් සංරක්ෂණයට යොමු කිරීම.
- මල්වගා හා උද්‍යාන අලංකරණ ජාතික ඩිප්ලෝමාව NVQ 5,6 මට්ටම ආරම්භ කිරීම හා වෘත්තීය නිපුණතා සහතික නිකුත් කිරීම.

- ❖ උද්‍යාන අලංකරණය සහ මල්වගා සම්බන්ධව උපාධි පාඨමාලා පවත්වන ආයතනයක් ලෙස සංවර්ධනය කිරීම.
- ❖ පරිසර විද්‍යාත්මක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ අදාල SDG ඉලක්ක සපුරා ගැනීම.
- ❖ මාර්ගගත ප්‍රවේශ පත්‍ර ක්‍රමයක් ස්ථාපිත කිරීම.
- ❖ නරඹන්නන් සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ ඵලදායිතා ස්වර්ණ සම්මානය දිනා ගැනීමට කටයුතු කිරීම.
- ❖ හොඳම සංචාරක මධ්‍යස්ථානයට හිමි සහතික පත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ❖ සැමට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කර ජීවිතකාලය පුරාවට අධ්‍යාපන අවස්ථා ඇතිකිරීම.
- ❖ ජෛව විවිධත්ව සංරක්ෂණ, කාන්තාරීකරණය පිටුදැකීම වෘක්ෂලතා සංරක්ෂණය මගින් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම.
- ❖ දැනට උද්භිද උද්‍යාන පිහිටුවා නැති විශේෂිත කලාපවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම.
- ❖ සුළු හා මධ්‍ය පරිමාණ මල් හා විසිතුරු පැළ ව්‍යවසායකයින් සඳහා ලබා දෙන දිරිගැන්වීම් පුළුල් කිරීම හා මල්වගා සංගම් සාමාජික සංඛ්‍යාව ඉහළ නැංවීම. හා ඔවුන්ගේ ජීවන මට්ටම ඔසවා තැබීමට දායක වීම.
- ❖ ශ්‍රී ලංකාවේ දල ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමේදී සංචාරක ක්ෂේත්‍රයේ සැලකිය යුතු දායකත්වයක් උද්භිද උද්‍යානය මගින් ලබාදීම.

03. පරිච්ඡේදය - වසරේ සමස්ථ මුල්‍ය කාර්ය සාධනය

03.1. මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

03.2. මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

03.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4. මුල්‍ය ප්‍රකාශ සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කළඹ 2022 රු.	2021 රු.	
300,000,000	ආදායම් ලැබීම්		388,379,319	135,038,572.00	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	388,379,319	135,038,572.00	
-	මූළු ආදායම් ලැබීම් (අ)		388,379,319	135,038,572.00	
-	ආදායම් නොවන ලැබීම්		-	725,045,954.00	
-	භාණ්ඩාගාර අග්‍රිම		333,361,000	583,881,000.00	ඒසිඒ-3
-	තැන්පතු		135,651,106	111,193,676.00	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		31,640,230	29,971,278.00	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මූළු ආදායම් නොවන ලැබීම් (ආ)		**500,652,336**	**725,045,954.00**	
-	මූළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**889,031,655**	**860,084,526.00**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		-	**860,084,526.00**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	**509,467,750.00**	
460,752,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	460,178,184	406,683,843.00	
114,048,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	111,421,407	101,283,323.00	ඒසිඒ-2(ii)
1,400,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,320,040	1,476,034.00	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	24,550.00	
576,200,000	මූළු පුනරාවර්තන වියදම් (ඊ)		**572,919,632**	**509,467,750.00**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	26,944,645	23,433,650.00	
28,850,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	21,525,172	91,767,956.00	
22,025,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	74,225,000	78,595,403.00	ඒසිඒ-2(ii)
74,225,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	හැකියා වර්ධනය	14	437,475	487,131.00	
500,000	වෙනත් මූලධන වියදම්	15	45,050,906	36,755,511.00	
45,500,000	මූළු මූලධන වියදම් (උ)		**168,183,198**	**231,039,652.00**	
171,100,000					
	තැන්පතු ගෙවීම්		132,030,235	98,458,414.00	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		31,132,742	30,451,860.00	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		163,162,977	**128,910,274.00**	
	මූළු වියදම් එ = (ඊ+උ+ඌ)		904,265,806	**869,417,676.00**	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(15,234,151)	**(9,333,150.00)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(15,234,151)	(9,333,150.00)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			-	-	

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	7,813,559,403	7,727,804,507
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	95,151,703	95,659,192
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**7,908,711,106**	**7,823,463,698**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(144,483,603)	(140,355,244)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		7,813,559,403	7,727,804,507
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	239,635,307	236,014,436
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**7,908,711,106**	**7,823,463,698**

පිටු අංක...01....සිට... 52... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...53..... සිට ...61.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	S. A. Krishnarajah	2023/2/14
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ඩබ්. ඒ. චූලානන්ද පෙරේරා	නම : ආචාර්ය එස්.ඒ. ක්‍රිෂ්ණරාජා	නම : ඒ.ඒ.සී. නිදිගෙගේ
තනතුර : ලේකම් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	ප්‍රධාන ගණකාධිකාරි
දිනය : 2023.02.21. දෙවන මහල, ඇසෙට් ආකේඩ් ගොඩනැගිල්ල, 51/2/1, යෝර්ක් වීදිය, කොළඹ 01.	දිනය : 2023.02.14 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පේරාදෙණිය	දිනය : ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පේරාදෙණිය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කණ්ඩායම	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	388,379,319	135,038,572
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	38,103,292	28,445,549
අග්‍රිම ලැබීම්	333,361,000	583,881,000
අක්තිකාරම් අයකර ගැනීම්	30,472,657	29,382,244
තැන්පතු ලැබීම්	135,651,106	111,193,676
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	925,967,374	887,941,041
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	643,629,437	568,602,369
සභානාධාර සහ මාරුකිරීම්	75,545,040	80,095,987
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	22,104,747	18,564,455
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අක්තිකාරම් ගෙවීම්	31,132,742	30,451,860
තැන්පතු ගෙවීම්	132,030,235	98,458,414
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	904,442,202	796,173,085
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	21,525,172	91,767,956
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	21,525,172	91,767,956
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	21,525,172	91,767,956
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(21,525,172)	(91,767,956)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.00

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.03.02.19	උද්භිද උද්‍යාන ආදායම	700.00	300	388	129%

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.00

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුදල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	576,200	576,200	572,516,451.90	99 %
ප්‍රාග්ධන	575,480	575,480	168,1883,197.69	99 %

3.7. මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.00

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2022** දිනට මුල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	*	661,691,908.82		
9152	යන්ත්‍රෝපකරණ	*	212,711,244.02		
9153	ඉඩම්	*	693,915,250.00	-	-
9154	අසපෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

*තක්සේරු මණ්ඩල පත්කර ඇත. 2023.03.31දිනට පෙර තක්සේරු වාර්තා ලබාදෙන ලෙස සියළුමඅංශ දැනුවත් කර ඇත.

ඒ අනුව 2023.03.31 දිනට පෙර දෙපාර්තමේන්තුව සතු සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට සැලසුම් කර ඇත. (ඉඩම් හා ගොඩනැගිලි සඳහා තකසේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ලැබිය යුතු වේ.)

3.8. විගණකාධිපතිවරයාගේ වාර්තාව (ඇමිණුම් අංක **01**)

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම		
		100% - 90 %	75% - 89%	50 % - 74 %
1	වෘක්ෂලතා පිළිබඳ ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම			
	• පවත්වන ලද විශේෂ රැස්වීම් සංඛ්‍යාව	√		
	• ක්ෂේත්‍ර චාරිකා ගණන			√
	• හඳුනාගත් ශාක විශේෂ		√	
	• සොයාගත් නව ශාක විශේෂ			√
2	ශාක විතැන් සංරක්ෂණ කටයුතු			
	• විතැන් සංරක්ෂණය කළ ශාක විශේෂ	√		
	• ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව			√
3	පැළ නිෂ්පාදිත ප්‍රමාණය	√		
4	පර්යේෂණ සංඛ්‍යාව	√		
5	ජාතික ශාකාගාරයේ වැඩිදියුණු කිරීම්			
	• නව ආම්පන්න මිලදී ගත් ප්‍රමාණය		√	
6	අධ්‍යාපන, පුහුණු වැඩසටහන් හා තොරතුරු බෙදාදීම			
	• අධ්‍යාපන වැඩසටහන් ගණන			√
	• පුහුණු වැඩසටහන් ගණන			√
	• තොරතුරු සැපයූ පුද්ගල ප්‍රමාණය	√		
7	උද්‍යාන වලට පැමිණෙන නරඹන්නන් සඳහා වන පහසුකම් ඉහළ නැංවීම			
	• ජල පහසුකම් ස්ථාපිත කිරීම්වල නිමකිරීම්		√	
	• නව ගොඩනැගිලි හා ආකෘති ඉදිකිරීම්වල නිමකිරීම් (වැසිකිළි,ගිමිහාන කුටි,කෞතුකාගාර)			√
8	මල්වගා සංවර්ධන කටයුතු			
	• පැවැත්වූ මල්වගා ප්‍රදර්ශන			√
	• මල්වගා කරුවන්ට පැවැත්වූ පංති සංඛ්‍යාව			√
	• මල්වගාකරුවන්ට බෙදාදුන් ද්‍රව්‍ය ප්‍රමාණය	√		
9	කාර්ය මණ්ඩල පහසුකම් ඉහළනැංවීම			
	• සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්		√	
	• මිලදී ගත් කාර්යාල උපකරණ ප්‍රමාණය	√		
	• ඉදිකරන,නවීකරණය කරන ලද කාර්යාලීය ගොඩනැගිලි	√		
	• නවීකරණය, අලුත්වැඩියා කරන ලද නිලනිවාස	√		
10	ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට දායක වීම			
	• වාර්ෂික ආදායම	√		
	• දේශීය සංචාරකයින්			√
	• විදේශීය සංචාරකයින්			√

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49	50-74	75-100
සියලුම තැන්හි සියලුම ආකාරයේ දුප්පත්කම තුරන් කිරීම	ශ්‍රී ලංකාවේ මල්වගා කරුවන් සවිබල ගැන්වීම	• පිහිටවූ සමිති සංඛ්‍යාව • පැවැත්වූ මල්වගා ප්‍රදර්ශන සංඛ්‍යාව • පැවැත්වූ පුහුණු පංති හා • • • වැඩමුළු සංඛ්‍යාව • තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම සඳහා පැවැත්වූ රැස්වීම් හා ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව • කාලීන ගැටළු විසඳීම සඳහා සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව			√
සැමට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කර ජීවිතකාලය පුරාවට අධ්‍යාපන අවස්ථා ඇතිකිරීම	විවිධ වයස් මට්ටම්වල මහජනතාව ශාක සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම	• පරිසර ශාක හා ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ පැවැත්වූ අධ්‍යාපන වැඩසටහන්			√
	තරුණ තරුණියන් හට ස්වයං රැකියා අවස්ථා හා රැකියා සලසා ගැනීමට අවස්ථා සැලසීම	උද්‍යානය තුල වෘත්තීය පාඨමාලා හරහා තරුණ තරුණියන් පුහුණු කිරීම් ප්‍රමාණය (NVQ 3,4 හරහා)පැවැත්වූ පාඨමාලා සංඛ්‍යාව			√
ජෛව විවිධත්ව සංරක්ෂණ, කාන්තාරීකරණය පිටුදැකීම වෘක්ෂලතා සංරක්ෂණය මගින් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම	ශාක විතැන් සංරක්ෂණය	• විතැන් සංරක්ෂණය කළ ශාක ප්‍රමාණය • වඳවී ගිය ශාක නැවත පිහිටි වාසස්ථාන සඳහා හඳුන්වා දුන් ප්‍රමාණය • දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය • දැනුවත් කළ පුද්ගලයින් ප්‍රමාණය			√
	උද්භිද උද්‍යාන ආදායම් වර්ධනය	• නරඹන්නන් සංඛ්‍යාව • වාර්ෂික ආදායම		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- දෙපාර්තමේන්තුව මගින් මල්වගා සංවර්ධන වැඩසටහන් යටතේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 8500 ක් පමණ සවිබල ගැන්වීමට ක්‍රියාකර ඇත. මෙමගින් තිරසර සංවර්ධන ඉලක්ක 01 වන සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම සඳහා යන ඉලක්ක ලගා කර ගැනීමට දායක වී ඇත. මේ හරහා මල්වගා සංවර්ධන වැඩසටහන් සඳහා විශාල වශයෙන් දායක වන කාන්තාවන් සවිබල ගැන්වීමද සිදුවේ. මේ හේතුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක 05 වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලගාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීමේ අරමුණ වෙත ද ලඟා වීමට දායක වී ඇත. මෙමගින් ස්වයං රැකියා අවස්ථා සහ ව්‍යාපාරික අවස්ථා උදාවී ඇති බැවින් ආර්ථික සංවර්ධනයට දායක වීමද සිදුව ඇත. මෙය තිරසර සංවර්ධන ඉලක්ක 8 වන සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ වෙත ලගාවීමේදී ඍජු දායකත්වයක් ලබා දී ඇත.
- උද්‍යානය තුළ වෘත්තීය පාඨමාලා හරහා තරුණ තරුණියන් පුහුණු කිරීම් යටතේ සිසුන් 11,386ක් පමණ ප්‍රමාණයක් (NVQ 3,4) හරහා විවිධ පාඨමාලාවන් යටතේ පුහුණු කිරීම් තුළින් ඉලක්ක අංක 04 වන පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථා සැලසීම යන ඉලක්කය වෙත ලඟා වීමට හැකියාව ලැබී ඇත.
- විශේෂයෙන්ම සියලුම උද්භිද උද්‍යාන වල ශාක විතැන් සංරක්ෂණය කිරීම තුළින් හා වඳවී ගිය ශාකයන් නැවත පිහිටි වාසස්ථාන තුළ රෝපණය කිරීම තුළින් ජෛව විවිධත්ව සංරක්ෂණයට මෙන්ම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කිරීමේ කාර්යයට දායකත්වය ලබා දී ඇත. තවද 629,916 ක පැල නිෂ්පාදනය කිරීම තුළින් ශාක ආරක්ෂා කිරීමට දායකත්වය ලබා දී ඇත. ඒ තුළින් ඉලක්ක 15 වන, භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්තාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන ඉලක්කය වෙත ලගා වීමට ඍජු දායකත්වයක් ලබා දී ඇත.
- සමස්ථ උද්භිද උද්‍යානවල ආදායම මිලියන 668 ක් වැනි ප්‍රමාණයකට වර්ධනය කර ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික වර්ධනයට ඍජු දායකත්වයක් ලබා දීම තුළින් ඉලක්ක 8 වන, සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන ඉලක්කය වෙත ලඟා වීමට ඍජු දායකත්වයක් ලබා දී ඇත.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජේෂ්ඨ මට්ටම	34	24	10
තෘතීය මට්ටම	9	3	6
ද්විතීය මට්ටම	189	173	16
ප්‍රාථමික මට්ටම	683	549	134
	915	**749**	**166**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හා අතිරික්තය බලපෑ ඇති ආකාරය

- විද්‍යාත්මක හා තාක්ෂණික කාර්ය මණ්ඩලය හිඟවීම උද්භිද උද්‍යානවල ශාක සංරක්ෂණ හා අනෙකුත් විද්‍යාත්මක තාක්ෂණික හා යටිතල පහසුකම් සංවර්ධන කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව කරගෙන යාමේ අපහසුතාවයක් ඇත.
- ආයතනයේ කාර්ය සාධනය ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා දැනට සිටින නිළධාරීන්ගේ රාජකාරී වපසරිය වැඩිකිරීමෙන් අවශ්‍ය රාජකාරීන් ඉටුකර ගනු ලබයි.
- ප්‍රාථමික මට්ටම සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවය සපයා ගැනීමෙන් අදාල සේවක හිඟය පියවාගෙන දෙපාර්තමේන්තුවේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සිදුකරයි.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහන ස්වභාවය (දේශීය / විදේශීය)	නිමවුම / ලබාගත් දැනුම
			දේශීය (රු.)	විදේශීය		
සංවර්ධන නිළධාරී සේවයේ iii ශ්‍රේණියේ තනතුරට පත් කිරීම - ඒක්දින සේවාරම්භක පුහුණුව	08	2022.01.21 පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා	100,80.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය, මූලික ගිණුම් හා කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම
බැටිරි කාර් රියදුරන් සඳහා වන සේවාරම්භක පුහුණුව	18	2022-01-31 8.30 – 4.00 දක්වා	180,50.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
කළමණාකරණ හා තාක්ෂණ පුහුණු වැඩසටහන	10	2022.03.03 9.30- 4.15 දක්වා	-	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
උද්‍යාන සංවර්ධන සේවාරම්භක පුහුණු වැඩසටහන	10	2022-03-25 9.00 – 3.30	-	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
රාජ්‍ය සේවකයින්ගේ ධනාත්මක ආකල්ප සංවර්ධනය	78	2022-03-25 8.00 – 4.30	රු.98,900.00	-	දේශීය	ආකල්ප සංවර්ධනය
මූලික විමර්ෂණ	49	2022-03-28 8.30 – 5.00	44,585.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහන ස්වභාවය (දේශීය / විදේශීය)	නිමවුම / ලබාගත් දැනුම
			දේශීය (රු.)	විදේශීය		
මූ.රෙ.104 අලාභ හානි වාර්තා හානි පූර්ණය හා ගිණුම් තැබීම	54	2022-03-29 8.00 – 4.30	44,500.00	-	දේශීය	අලාභහානි පිළිබඳ මූලික දැනුම
ගාස්තු අයකිරීම් සහකාර සේවාරම්භක පුහුණුව	05	2022-04-22 8.00 – 4.30	-	-	දේශීය	වෘත්තියට අදාල මූලික දැනුම
අභ්‍යන්තර විගණන හා අභ්‍යන්තර පාලන ක්‍රම	05	2022-08-15 8.00 – 4.00	.7,500.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම
ප්‍රවාහන කළමණාකරු	01	2022-10-13 8.00 – 4.00	4,000.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
ස්ථීර වත්කම් පවත්වාගෙන යාම	02	2022-08-18 8.00 – 4.00	4,000.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
රාජ්‍ය නිළධාරියෙකුට හිමි නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් පිළිබඳ පුහුණුව	02	2022-08-18 8.00 – 4.00	7,500.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
විගණන ප්‍රශ්න අවම කරලන්නේ කෙසේද	04	2022-08-24 9.00 – 4.00	7,500.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
ප්‍රාථමික ශ්‍රේණි සේවකයින් සඳහා විෂයානුබද්ධ පුහුණුව (1 වැඩසටහන)	19	2022-09-14 8.00 – 4.00	30,650.00	-	දේශීය	උද්‍යාන අලංකරණය පිළිබඳ ලෝකයේ නව ප්‍රවණතා
ප්‍රාථමික ශ්‍රේණි සේවකයින් සඳහා විෂයානුබද්ධ පුහුණුව (2 වැඩසටහන)	18	2022-08-18 8.00 – 4.00		-	දේශීය	උද්‍යාන අලංකරණයට අවශ්‍ය නවීන යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහන ස්වභාවය (දේශීය / විදේශීය)	නිමවුම / ලබාගත් දැනුම
			දේශීය (රු.)	විදේශීය		
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	01	2022-11-03,04 9.00 – 4.00	9,000.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
කාර්යාල ක්‍රම	43	2022-11-09 9.00 – 4.00	14,500.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම
ප්‍රාථමික ශ්‍රේණි සේවකයින් සඳහා විෂයානුබද්ධ පුහුණුව (2 වැඩසටහන)		2022-12-02 9.00 – 4.00	22,000.00	-	දේශීය	සමස්ථ කාර්ය භාරය පිළිබඳ මූලික දැනුම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍යනිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාරහා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත්හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍යපරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙනයාම	අනුකූල නොවේ		
2.2	පුද්ගලපඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		2023 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලැබේ.
2.3	විගණනවිමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත්හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රිලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම්ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3	**මූල්‍යපාලනය සඳහා කාර්යන් අභියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛයාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014. 05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංගපැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසුම් සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
4.5	වාර්ෂිකමුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවටඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් විමසුන් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට මසකට වඩා ප්‍රමාද වේ.	සිහිකැඳවීම් යොමු කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණනවාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල්රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත්විගණකාධිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණනහා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂයතුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදයට අනුව, වත්කම් මිලදීගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහ තසඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධානක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එමනිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනටවිගණකාදධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	වෙනත් නිර්දේශ චක්‍රෙල්ඛයේසඳහන් කාලය තුළ සිදුකොට තිබීම			
8.5	ගර්හිතභාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිතවාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනටවිගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්තික වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ	වාහනයේ අයිතිය පිළිබඳ ගැටළු	අදාල ලේඛන කොම්ට්‍රෝලර් ජනරාල් කාර්. වෙත යවා ඇත.
9.3	වාහනලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑමවාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම වීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චකුලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධානප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	ඉන්ධන නිකුත් කරන්නේ QR ක්‍රමවේදයට බැවින් හා ඉන්ධන ප්‍රතිපාදන සීමාසහිත වීම වීම	ප්‍රමාණවත් ඉන්ධන ප්‍රතිපාදන ලැබුණු පසු ඉනධන දහන පරීක්ෂාව සිදු කිරීම සුදුසු වේ
9.6	කල්බදුකාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරතිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිතවර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකුසැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන්මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**පුතිපාදන උපයෝජනය**			
11.1	සලසාතිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයොජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරිප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකමවලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ටවලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටිණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකටවැඩි කාලයක සිට පැවෙත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදුතැන්පත් ගිණුම**			
13.1	කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදුතැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිතවර්ෂය අවසානයෙදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණයකර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත කළ තක්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වීමාසයක් ඇතුලතනිරවුල්කර තිබීම	අනුකූල නොවේ		2023 වර්ෂයේ අභ්‍යන්තර චක්‍රෙල්ඛයක් නිකුත් කර ඇත.
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තක්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කරතිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිමගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාලරෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමතකාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	සංවර්ධන නිළධාරීන් අනුමත කාර්යමණ්ඩල සීමාව ඉක්මවා අනුයුක්ත කර ඇත	අනුමත කාර්ය මණ්ඩල සීමාව වැඩි කිරීම සඳහා ඉල්ලීම් කර ඇත
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවාදෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරුදැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක්වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම			
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානවසම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවමවශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවරු කොට තිබීම	අනුකූල නොවේ	වසරේ මුල් කාර්තුව තුළ පැවති වාතාවරණය තුළ වැඩසටහන් සංවිධානය කිරීමට තිබූ දුෂ්කරතාව හා පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සීමාවීම.	ප්‍රමාණවත් ප්‍රතිපාදන සැපයීම
19.3	ඉහතසඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලයසඳහාම වාර්ෂික කාර්ය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	දැනට පවතින ආකෘතිය අනුව කාර්ය සාධනය සිදු කරනු ලබයි	චක්‍රලේඛනයට අනුව කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමට සාමූහිකව කටයුතු කිරීම
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානවසම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨනිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
20	විගණනඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත්ව ර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දි ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා වූ භාර අරමුදල

වාර්ෂික වාර්තාව - 2022 වර්ෂය

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් 1995.12.15 වැනි දින එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ගරු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යානවලට ඇතුළුවීම සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා වූ භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනීම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනීමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

<u>උද්භිද උද්‍යාන භාර අරමුදල</u>

1.	අරමුදලේ නම	:	**ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල**
2.	ස්වභාවය	:	**උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු, සුභ සාධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතු වලට මූල්‍ය සහාය ලබාදීම.**
3.	අදාල චක්‍රලේඛයන්	:	**i.** අරමුදල ආරම්භ කිරීම - **1917** අංක **09** දරණ අරමුදල් ආඥා පනත අනුව **ii.** ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ **1977** අගෝස්තු **16** දිනැති අංක **836** දරණ චක්‍රලේඛය හා **2006.12.22** දින නිකුත් කළ රාජ්‍ය මුදල් චක්‍රලේඛ **PF/423** අනුව
4.	ආරම්භ කළ දිනය	:	**1996** දෙසැම්බර් **20**
5.	කාර්යාලය	:	පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය
6.	බැංකුව	:	පේරාදෙණිය ලංකා බැංකුව - ගිණුම් අංක **0007040848**

7. අරමුදලේ පරමාර්ථ:

- උද්භිද උද්‍යාන පිළිබඳව ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල ඇති ආකල්ප ප්‍රසස්ථ කිරීමට අදාලව ක්‍රියාකාරකම් සිදු කිරීම.

- පාරිසරික හා අධ්‍යාපනික ලෙස පැළෑටි සංරක්ෂණය සඳහා අර්ථවත් වැඩසටහන් ඇරඹීම හා දියත් කිරීම.

- උද්භිද උද්‍යානයනවල සේවය කරන විද්‍යාඥයින්ට තම විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩිදියුණු කරගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම හා ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ ඕනෑම ද්‍රව්‍යයක් මිලදී ගැනීම.

- පැළ එකතුව වර්ධනය කරගැනීමට පියවර ගැනීම.

- තාක්ෂණික ක්ෂේත්‍රවල සිදු කරන උද්භිද උද්‍යාන සංවර්ධනයට තුඩු දෙන පාරිසරික, අධ්‍යාපනික, සංරක්ෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා සහාය වීම.

- විද්‍යාඥයින්ට පහසුකම් සැලසීම හා උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන ජනයාට අවශ්‍ය කරන හදිසි තැනීම් ඉදිකිරීමට පියවර ගැනිම.

- විශේෂිත වූ වැඩසටහන් සඳහා පුනරාවර්තන අරමුදල් හිඟයන් පිරිමැසීම.

2022 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය

2022-01-01 දිනට බැර ශේෂය	=	රු. 203,634,468.72
එකතු කළා:		
2022 වර්ෂයේ ආදායම (බැර කිරීම්)	=	රු. 111,900,383.77

	එකතුව	රු. 315,534,852.49
අඩු කළා :		
2022 වර්ෂයේ වියදම් (හර කිරීම්)	=	රු. 106,002,502.54

2022.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය	=	**රු. 209,532,349.95**

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමණි)

අරමුදලේ ප්‍රධාන පරමාර්ථයක් වන ''ශ්‍රී ලංකාව තුල හා විදේශ රටවල් තුල ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තව දුරටත් ඉහල නැංවීම'' අරමුණු කරගෙන පහත සඳහන් කටයුතු අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2022 වර්ෂයේ දී ඉටු කරන ලදී.

රාජකීය උද්භිද උද්‍යානය පේරාදෙණිය

- 200 වසරක ඉතිහාසයක් පවතින රාජකීය උද්භිද උද්‍යානයේ ඉපැරණි කෞතුක වටිනාකමකින් යුතු භාණ්ඩ, දෙස් විදෙස් සංචාරකයින් හට ප්‍රදර්ශනය කිරීම සඳහා 2022 වර්ෂයේ දී උද්‍යාන භාර අරමුදල යටතේ රු.මි. 41 වැය කර කෞතුකාගර ගැලරිය නවීකරණය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

- රාජකීය උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය ළමුන්ගේ විවිධ ශාක විශේෂ පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ඉදිකරමින් පවතින ළමා අධ්‍යාපනික ඒකකයේ සංවර්ධන කටයුතු උද්‍යාන භාර අරමුදල මගින් රු.මි.3.5 වැය කරමින් 2022 වර්ෂයේදී සිදු කරන ලදී.

ගම්පහ උද්භිද උද්‍යානය

- ගම්පහ උද්භිද උද්‍යානයේ පහළ සීමාවේ ඉදිකර ඇති වැව හා නව තෘණ පිටියට මායිම්ව ගලා යන අත්තනගලු ඔය ඉවුර සංරක්ෂණය කිරීමේ අරමුණින් ගේබියන් බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ V වන අදියර 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදී. අධික වර්ෂා කාලයේදී ඇති වන නිරන්තර ගංවතුර තත්වයන් මගින් ඉවුර බාදනය වීම පාලනය කර ගැනීම හා උද්‍යානයේ දකුණු සීමා මායිම හා අත්තනගලු ඔය අතර ඇති පටු බිම් තීරුව සංරක්ෂණය කිරීම මෙහි මූලික පරමාර්ථය වේ. මේ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් රු.මි. 1.6ක මුදලක් වැය කර ඇත.



මල්වගා හා උද්‍යාන අලංකරණ පුහුණු විදුහල

- NVQ –Level – 4 උද්‍යාන අලංකරණ ශිල්පී පාඨමාලාව හා සිව් මාසික මල්වගාව හා උද්‍යාන අලංකරණ පාඨමාපාව හැදෑරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව අවස්ථාව ලබා දී ඇති අතර, එම පාඨමාලාවන් යටතේ පුහුණුව ලබන පුහුණුලාභීන් ඔවුන් ඉටුකරන ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලට අදාලව උද්‍යානයේ විවිධ අංශවල සංවර්ධන කටයුතු හා නඩත්තු කටයුතු සඳහා ඔවුන්ගේ ශ්‍රමය ලබා දීමෙන් දායක වේ.එමෙන්ම මල්වගාව පිළිබඳ උනන්දුවක් දක්වන බාහිර පාර්ශවකරුවන් හට පුහුණු වැඩසටහන් පැවැත්වීම ද 2022 වර්ෂයේදී සිදු කෙරිණි.

  මේ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් රු.මි.0.5 පමණ වියදම් දරණ ලදී.







ජාතික ශාකාගාරය

- **ශාක ගවේෂණය හා පර්යේෂණ කටයුතු**

උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන-2022

තර්ජනයට ලක්වූ ශාක සංරක්ෂණය ඉලක්ක කර ගනිමින් ජාතික ශාක ගවේෂණ වැඩසටහන සෑම වසරකම සැලසුම් කරනු ලැබේ. 2022 වර්ෂයේදී එය ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති4 ඔස්සේ සිදු කෙරිනි.

ඒ අනුව ශාක සමීක්ෂණ කටයුතු සඳහා ගවේෂණ 16 ක් දින 20 ක් තුළ ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා එක්දින ගවේෂණ 13 ක්, දෙදින ගවේෂණ වැඩසටහන් 02ක්හාතෙදිනගවේෂණවැඩසටහන් 01 ක්ඇතුළත් විය. මෙම සිළුම ගවේෂණ තුළින් ශාක නිදර්ශක 850 ක් පමණ රැස් කර ඇත.

සැලසුම් කර තිබූ ප්‍රධාන ගවේෂණ ව්‍යාපෘති4 ට අමතරව, මහනුවර දිස්ත්‍රික්කයේ ගන්නෝරුව රක්ෂිතයේ සහ වික්ටෝරියා-රන්දෙණිගල රක්ෂිතයේ ගවේෂණ කටයුතු සිදු කරන ලදී.

මෙම ශාක ගවේෂණ වැඩසටහන් මඟින් 2022වසරතුළදිසපුෂ්පශාකවිශේෂ 350 ක්පමණරැස්කරඇත. ඒඅතරින්විශේෂ 92 ක්වඳවීමේතර්ජනයටලක්වඇතිඅතරවිශේෂ 25% ක්පමණලංකාවටආවේණිකවේ. තවද, ගවේෂණ මඟින් රැස් කර ගන්නා ලදසපුෂ්ප ශාක නිදර්ශක 660 ක් , මීවන ශාක නිදර්ක 35 සහ පාසි ශාක නිදර්ශක 38 ජාතික ශාකාගාරයේ නිදර්ශක එකතුව සඳහා ඇතුළත් කරන ලදි.






විවිධ පරිසර පද්ධති තුළ ශාක ගවේෂණ කාර්යයන් වල යෙදෙමින්

හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතය ගවේෂණය

ශ්‍රී ලංකාවේ දැඩි ස්වභාවික රක්ෂිත තුනෙන් තෙත් කලාපයේ ඇති එකම දැඩි ස්වභාවික රක්ෂිතය මෙය වේ. 2022වසරේදිසිදු කරන ලද ගවේෂණ කටයුතු වලට අනුව, ශාක විශේෂ 41 ක් හඳුනාගෙන ඇති අතර ඉන් විශේෂ 17ක් ශ්‍රීලංකාවට ආවේණික විශේෂ වේ .2020 රතුදත්ත ලැයිස්තුවට අනුව,හඳුනාගත් විශේෂවලින් විශේෂ 16ක්ව ඳවීමේ තර්ජනයට ලක්ව ඇත.

ගම්පහ දිස්ත්‍රික්කයේ ශාක ගවේෂණය

මෑතක සිට අධික වශයෙන් විවිධ සංවර්ධන කටයුතුහා ඉදිකිරීම් සිදු කරනු ලබන ගම්පහ දිස්ත්‍රික්කයේ වෘක්ෂලතා සංරක්ෂණය හා සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙම සමීක්ෂණයෙන්එ ක්‍රියාත්මක කරන ලද දත්ත සහ තොරතුරු වැදගත් වේ.ගවේෂණ වලදී සපුෂ්පශාකනිදර්ශක 121ක්සහපර්ණාංගනිදර්ශක 11 ක්‍රියාත්මක කරනලදී. හඳුනාගෙන ඇති සපුෂ්ප ශාක විශේෂ 90න් විශේෂ 15 ක්ශ්‍රී ලංකාවට ආවේණික වන අතර විශේෂ 12 ක් 2020 ජාතික රතු දත්ත ලැයිස්තුවට අනුව තර්ජනයට ලක්ව ඇත.



භක්ගලදැඩිස්වභාවික රක්ෂිතයෙන්වාර්තාවූආවේණිකවිශේෂ:
1. *Actinodaphnespeciosa*(VU), 2.*Impatiens macrophylla*(VU), 3.*Impatiens truncata*(NT),4.*Calophyllumtrapezifolium*(VU), 5.*Lasianthusgardneri* (NT), 6.*Calophyllumwalkeri*(VU)



*Strobilanthesadenophora*ආවේණික නෙලු විශේෂයකි. ගම්පහ දිස්ත්‍රික්කයේ වනාන්තර වලින් වාර්ථා වූ තර්ජනයට ලක්වූ ශාක විශේෂයකි

Diospyros(කළුවර) ශාක ගණයේ තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය කිරීම

මෙමව්‍යාපෘතිය සඳහා කොට්ටාව/කන්නෙලිය, රංගල (නකල්ස්), සිංහරාජ රක්ෂිතය, කෑගල්ල සහ මහනුවර ආශ්‍රිත ප්‍රදේශවල ගවේෂණ කටයුතු සිදු කරන ලදී. මෙහිදී*Diospyros*විශේෂ 14කින්, DNA නිස්සාරණය සඳහා සහ වියළි නිදර්ශක තැන්පත් කිරීම සඳහා අවශ්‍ය සාම්පල මෙන්ම ශාක සංරක්ෂණය සඳහා අවශ්‍ය ප්‍රචාරණ ද්‍රව්‍ය ලෙස බීජ ද එකතු කරන ලදී. *Diospyrosquaesita*, *Diospyrossrilankana*හා *Diospyroskoenigi*යන විශේෂවල සජීවී ශාක,විතැන් සංරක්ෂනය සඳහා රාජකීය උද්භිද උද්‍යානයේ තවාන් තුළ ස්ථාපිත කරන ලදී.

මෙම කුලයට අයත් ශාක සංරක්ෂනය අතිශයින් වැදගත් බව හඳුනාගත් බැවින් ඊට අදාළ පර්යේෂන කටයුතු දිර්ඝ කිරීමේ අපේක්ෂාවෙන් අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහාBotanic Gardens

Conservation International ආයතනය වෙත ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ අතර ඊට අදාළ අනුමැතිය හා ඇ. ඩො. 2500ක මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හැකිවිය.



*Diospyrosatrata*ශාකයේ - 1. ඵලය, 2.ඵලයේ හරස්කඩ, 3. දිරාපත්වන ඵලය, 4. බීජය

*Acrotrema*ශාක ගණයේ පර්යේෂණ

Dilleniaceaeශාක කුලයටඅයත් *Acrotrema*ශාක විශේෂ 7 ක් ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අතර ඉන් විශේෂ 6 ක් ඒකදේශික වේ.කන්නෙලිය, කිතුල්ගල-මාකන්දාව සහ අමනාවල වනාන්තර, සිංහරාජ-එනසාල්වත්ත, මරේ වතුයාය සහ ශ්‍රී පාදය-එරත්න මාර්ගය යන ස්ථානවල ගවේෂණ හයක් සිදු කරන ලද අතර අනුක ජීව විද්‍යාත්මක පර්යේෂණ කටයුතු ආරම්භ කර ඇත.



අණුක ජීව විද්‍යාත්මක පර්යේෂණ

2022 වර්ෂයේ ශාක ගවේෂණ කටයුතුවලදී වාර්තා වූ විශේෂ

- **වඳවී ගොස් ඇතැයි සැක කරන කාණ්ඩයට අයත් විශේෂ. [Critically endangeredpossibly extinct- CR(PE)]**



Aspleniumgrevillei

(Aspleniaceae)

පර්ණාංගවිශේෂයකි.
1887වර්ෂයේදීමාතලේ,වැහිගල,මහනුවර,ගම්පොලයන ප්‍රදේශවලින්මුල්වරටවාර්තාවීඇත.කිතුල්ගලමාකන්දා වක්ෂේත්‍රගවේෂණයන්මඟින්2022 වර්ෂයේදීනැවතත්අනාවරණයකරගන්නාලදී.

- **ඉතා දැඩිලෙස තර්ජනයට ලක්වීඇති ශාක කාණ්ඩයට අයත් විශේෂ. (Critically endangered-CR)**



Cajanus heynei –(Fabaceae)
අවසන්වරට1925දීමහනුවරlady's Horton driveහිවාර්තාවීඇත.2022දීගලබොඩවත්ත - රංගලගවේෂණයේන්හමුවිය



Andrographispaniculata–(Acanthaceae)
ගම්පහ-අලවල වනාන්තරයේන්වාර්තාවිය.







*Amomum nemorale-(*Zingiberaceae)
කන්නෙලිය රක්ෂිතයෙන් වාර්තා විය.





*Aponogetonkannangarae*M.A.Silva, Deshaprema&Manamperi (Aponogetonaceae) රක්වාන කදුකරයෙන් හමු වූ නව විශේෂයක් ලෙස 2016 දී වාර්තා විය. 2022 දී සිංහරාජ එනසල්වත්තප්‍රදේශයෙන් හමුවිය.



Acrotremadissectum –(Dilleniaceae) 1969 දී නෙළුව පැලවත්තප්‍රදේශයෙන් වාර්තා වූවාට පසු එම ප්‍රදේශයෙන්ම 2022 දී නැවත වාර්තා විය

- **ශාක උද්භිද විද්‍යාත්මකව හඳුනාගැනීම**

විශ්වවිද්‍යාල,ආයුර්වේදසහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතයෙන්හි විවිධ පර්යේෂණ,හා අධ්‍යාපන කාර්යයන් සඳහා සපුෂ්ප ශාක නිදර්ශක 107 ක්සහ වෙනත් ශාකසාර කර්මාන්ත සහ සාමාන්‍ය ජනතාවසඳහා සපුෂ්ප ශාක නිදර්ශක 15 හඳුනාගන්නා ලදි. ශාකාගාරයේ 825 තැන්පත් කිරීම සඳහා ශාකාගාර කාර්යය මණ්ඩලය විසින් ශාක නිදර්ශකක් හඳුනාගෙන ඇත. විවිධ පර්යේෂකයින්, විශ්වවිද්‍යාල සිසුන් සහ විවිධ ආයතන වලින් පැමිණි නිලධාරින් විසින් ශාකාගාරයේ නිදර්ශක භාවිතා කර නිදර්ශක 515 ක් විවිධ පර්යේෂණ සහ, අධ්‍යන කටයුතු සඳහා හඳුනා ගෙත ඇත.

2022 වසර තුළදී මහේස්ත්‍රාත් උසාවි, පොලිසි හා රේගු දෙපාර්තමේන්තුව මඟින් යොමු කරන ලද නඩු විභාග 09 කට අයත් සාම්පල් 31 ක් අදාල නීතිමය කටයුතු සඳහා හඳුනාගෙන වාර්තා සකසා ඉදිරිපත් කරන ලදි. මේ අතර ජීවී ශාක නිදර්ශක 20 ක් සහ දැව නිදර්ශක 11 ක් විය. පටක විද්‍යාත්මක දත්තසහ රූප විද්‍යාත්මක දත්ත ආශ්‍රිතව මෙම හඳුනාගැනීම් සිදු කරන ලදි.

- **වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්**

දින 06 ක් පුරාවට පවත්වන ලද විවෘත දින'රාජකීය උද්භිද උද්‍යාන ප්‍රදර්ශනය' (**'Royal Botanic Garden Gala Exhibition')** සඳහා විශේෂයෙන්ම අ.පො.ස සා/පෙළ සහ උ/පෙළ විෂය නිර්දේශ ඉලක්ක කර ගනිමින් "ශාක විවිධත්වය" තේමාව යටතේ ප්‍රදර්ශනය සකස් කරන ලදී. විවිධ ශාක කාණ්ඩ පිළිබඳ උද්භිද විද්‍යාත්මක තොරතුරු,රතු දත්ත ලැයිස්තුව පිළිබඳ තොරතුරු ආදි දත්ත ඇතුළත් කර විස්තරාත්මක පුවරු (Flexes) දහයක් සකස් කර මුද්‍රණය කරන ලදි. ශාකාගාරය මඟින් සම්පාදනය කරන ලද පොත්, පෝස්ටර් සහ පත්‍රිකා වැනි ප්‍රකාශන අලෙවි කිරීමටද කටයුතු කරන ලදි.

මීට අමතරව මෙම වසර තුළදී ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 17 විශ්ව විද්‍යාල සිසු සිසුවියන් 377 දෙනෙකු සඳහා ද වැඩසටහන් 09 පාසැල් සිසු සිසුවියන් 331 සඳහා සහ වැඩසටහන් 02 අනෙකුත් ආයතන වලින් පැමිණි නිලධාරින් 12 දෙනෙක් සඳහා ද පවත්වන ලදි. තවද භූමි අලංකරන සහ මල් වගා පුහුණු පාසැල මඟින් පවත්වනු ලබන ත්‍රෛයිමාසික පුහුණු පාඨමාලාවේසහ NVQපුහුණු පාඨමාලාවේ සිසු සිසුවියන් 375 ක් සඳහා ශාක නාමකරණය, වර්ගීකරණය, ශාක රූප විද්‍යාව සහ ජෛව විවිධත්වය පිළිබඳව වැඩසටහන් 06 පවත්වා ඇත.



විවෘත දින'රාජකීය උද්භිද උද්‍යාන ප්‍රදර්ශනය' සඳහා විවිධ මාතෘකා ඔස්සේ සකසන ලද විස්තරාත්මක පුවරු



විවෘත දින'රාජකීය උද්භිද උද්‍යාන ප්‍රදර්ශනය' ට දායකත්වය

- **ප්‍රකාශන**

රාජකීයඋද්භිදඋද්‍යානයේ දෙසියවස්පූර්ණ සැමරුම සඳහා ප්‍රකාශික ග්‍රන්තය සම්පාදනය කර මුද්‍රණය කිරීම හා වීඩියෝ පටය සකස් කිරීම ප්‍රධාන වශයෙන් ජාතික ශාකාගාරයේ දායකත්වයෙන් සිදු කරන ලදි.



- **ශාකාගාර සංරක්ෂණ කටයුතු වලට අදාල ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම**

ශාකාගාරයේ තැන්පත් කර ඇති වසර 200ක් පමණ පැරණිවියළි ශාක නිදර්ශක එකතුව සංරක්ෂණය සඳහා අන්තර් ජාතික මට්ටමේ ලේඛනාගාර සංරක්ෂක කටයුතු සිදු කරන ලදි.



ශාක සංරක්ෂණ කටයුතු

- **ශාකාගාරදත්තකළමනාකරණය**

ශාකාගාරයේදත්තබැංකුවයාවත්කාලීනකිරීම

මෙම වසර තුළදි පෞරාණික සහ නව ශාකාගාරයේ ඇති දේශීය නිදර්ශක 14,124 කඩිජිටල් ඡායාරූපදත්ත බැංකුවට ඇතුළත් කරන ලදි. මීට අමතරව වගා කරන ශාක වල (Cultivated Plants) නිදර්ශක 1,582 ක දත්ත ඇතුළුව ඩිජිටල් ඡායාරූපඅදාල දත්ත බැංකුවට ඇතුළත් කරන ලදි.මේ සඳහා අවශ්‍යය තීරු කේත සහ ඡායාරූප ගැනීම සඳහා අවශ්‍ය උපාංග උද්‍යානභාර අරමුදලේ ප්‍රතිපාදන මඟින් පසුගිය වර්ෂ තුළදී මිලදී ගෙන ඇත.

දැව ව්‍යුහ විද්‍යාත්මක දත්ත බැංකුව

ලංකාවේ දැව සඳහා භාවිතයට ගනු ලබන දැව විශේෂ පිළිබඳ ව්‍යුහ විද්‍යාත්මක දත්ත ඇතුළත් කර සකස් කරනු ලබන දැව ව්‍යුහ විද්‍යාත්මක දත්ත බැංකුව සඳහා මෙම වසර තුළදී දැව විශේෂ 16 ක දත්ත ඇතුළත් කරන ලදි. මෙම දත්ත,විශේෂයෙන් නීතිමය හඳුනාගැනීමේ කටයුතු සඳහා ආදර්ශ ව්‍යුහ ලෙස භාවිතයට ගත හැකි වේ.



හරස්කඩවල අන්වීක්ෂීය ඡායාරූප 1-*Diospyros oocarpa,* 2-*Madhuca neriifolia* 3-*Diospyros affinis*

- **ශාකාගාරය සංවර්ධන කටයුතු**

Central Engineering Consultancy Bureau (CECB) ආයතනය මඟින් උපදේශන ලබාගෙන ජාතික ශාකාගාරය සඳහා යෝජිත අණුක ජීව විද්‍යාගාරයේගොඩනැගිල්ලට අදාල යාන්ත්‍රික, විදුලි හා ජලනල කටයුතු සම්බන්ධ කාර්යයන් සඳහා, අවශ්‍යමූලික සැලැස්ම සකස් කරන ලදි.තවද රසායනාගාර සැලසුම්කරණය සඳහා අදාල සැලැස්ම ද අවශ්‍ය පරිදි උපදෙස් ලබා ගෙන සකස් කරන ලදි.






First
Aid

උද්භිද උද්‍යාන භාර අරමුදල - 2022 වර්ෂයේ වියදම

	කාර්යය	ඇස්තමේන්තුව (රු.)	2022 -12-31 දිනට මුළු වියදම (රු.)	ඉතිරි මුදල (රු.)
1	භාර අරමුදලේ වියදම	1,627,000.00	1,624,226.11	2,773.89
2	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම	53,005,000.00	53,003,497.74	1,502.26
3	ගම්පහ උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම	1,572,000.00	1,571,924.66	75.34
4	අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම	4,111,000.00	4,110,945.00	55.00
5	ජාතික ශාකාගාරයේ සංවර්ධන වියදම	6,910,000.00	6,908,804.95	1,195.05
6	අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධන වියදම	500,000.00	489,711.51	10,288.49
7	අක්මීමන කඩොලාන උද්‍යානයේ සංවර්ධන වියදම	6,500,000.00	6,499,999.94	0.06
එකතුව		74,225,000.00	74,209,109.91	15,890.09

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. CPCG/KD/E/DNBG/2/22/154(6)/C/30

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 30 දින.

ගණන්දීමේ නිලධාරී,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටොක්ත වාර්තාව සහ පරීක්ෂා කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමග ඉදිරිපත් කරමි.

එච්.ජී.ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත:- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය , කොළඹ -1.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. CPCG/KD/E/DNBG/2/23/154(6)/C/30

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික උද්භිද උද්‍යානදෙපාර්තමේන්තුව

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අවසාන දිනට පැවති මූල්‍ය නොවන වත්කම් රු. 7,727,804,451 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂය තුල දක්වා නොතිබුණි.	1.6 (ආ) i

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

මුදල් රෙගුලාසි506(ඈ) ප්‍රකාරව ඉදිරිපත් කර තිබූ සැසැඳුම් ප්‍රකාශය අනුව අවම ලැබීම් සීමාව රු. 22,000,000 ලෙස දක්වා තිබුණද, වාර්ෂික විසර්ජන පනත අනුව එම සීමාව රු.22,200,000 කි. ඒ අනුව සැසඳුම් ප්‍රකාශයේ අවම ලැබීම් සීමාව සහ වාර්ෂික විසර්ජන පනතේ අවම ලැබීම් සීමාව අතර රු.200,000 ක වෙනසක් පැවතුණි.

(ආ) දේපළ පිරියත හා උපකරණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.7,727,804,451 ක් වූ මූල්‍ය නොවන වත්කම්වල අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුල ආරම්භක ශේෂය ලෙස දක්වා නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වලට අදාළ කෙරිගෙන යන වැඩවල වටිනාකම හා අපහරණය කිරීම් පිළිබඳ කිසිදු ගැලපීමක් මූල්‍ය නොවන වත්කම් වලට අදාළ භාණ්ඩාගාර මුද්‍රිත SA 82 තුල ගිණුම්ගත කර නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනයේ වැඩ සටහන් අනුව වියදම් ප්‍රකාශය ඒසීඒ - 2 (i) අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු. 21,525,173 ක් පැවතුණද සිගාස් වැඩසටහන යටතේ SA 82 ආකෘතියේ වර්ෂයේ මිලදී ගැනීම් දක්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව 2023 වර්ෂයේ අවස්ථා 03 කදී ගෙවන ලද රු.1,174,871 ක වියදම් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල බැරකම් පිළිබඳ ප්‍රකාශය (ඇමුණුම-iv) තුල දක්වා නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව එක් එක් වැය විෂයයන් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම් හා බැඳීම්වලට එළැඹිය නොහැකි වුවද, වැය විෂයයන් 03 ක ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.1,968,451 ක බැරකම් වලට එළඹ තිබුණි.

2.2 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 753(2) ප්‍රකාරව නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලය වෙත අවස්ථා 02 ක දී ලැබී තිබුණු රු. 1,901,882 ක ගබඩා ද්‍රව්‍ය 03 ක් සඳහා ලැබීම් නියෝග නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 **තැන්පත් ශේෂයන්**

මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව වසර 02 ත් 05 ත් අතර කාලයට අදාළ, කාලය ඉකුත් වූ එකතුව රු. 1,071,880 ක තැන්පතු 07 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 **ගණුන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණුන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් ,එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් ,එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි .

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

දැදුරු ඔයේ සිට ගනේවත්ත ඖෂධ උද්‍යානය දක්වා ජල සැපයුමක් ලබා ගැනීම වෙනුවෙන් අවබෝධතා ගිවිසුමක් රහිතව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 03 කදී රු. 18,581,000 ක් ගෙවා තිබුණු අතර අදාල කටයුතු වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු. 1,323,623 ක් 2021 දෙසැම්බර් 16 දින ගෙවා තිබුණි. එසේ වුවද මෙම ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විටත් අවසන් කර නොතිබුණි.

3.2 **ප්‍රසම්පාදනයන්**

ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව තුල පිරිවැය ඇස්තමේන්තු කළ හැකි වහළය සවි කිරීම, යකඩ ගේට්ටු හා බිම් උළු ඇල්ලීම සම්බන්ධ වැඩ විෂයයන් 06 ක් සඳහා රු.970,000 ක Provisional sum වටිනාකම් ඇතුළත් කර ඉන් Provisional sum 04 ක් සඳහා ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා රු.776,357 ක් ගෙවීම් කර තිබුණි.

3.3 **වත්කම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ 2016 වර්ෂයේදී රු. 1,936,769 ක් වැය කර ඉදිකර තිබුණු ආපන ශාලාව 2020 පෙබරවාරි මාසයේ සිට භාවිතයකින් තොරව පැවතුණි.

(ආ) 2015 දෙසැම්බර් 29 දින රු. 593,340 ක් වැය කර රාජකීය උද්භිද උද්‍යානයේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කැබලි කිරීමේ යන්ත්‍රයක් (Multi chopper) මිලදී ගෙන තිබුණද, අදාළ යන්ත්‍රය සවි කිරීමේ ස්ථානයක් ඉදිකර නොතිබීම හේතුවෙන් වසර 07 ක කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.

(ඇ) 2019 වර්ෂයේ රාජකීය උද්භිද උද්‍යානයේ ඉදි කිරීමට සැලසුම් කර තිබුණු ආපන ශාලාව සඳහා රු. 547,432 ක පුටු 130 ක් හා රු.237,000 ක මෙස 30 ක් මිලදී ගෙන තිබුණද 2022 ඔක්තෝබර් 03 දින වන විටත් ආපනශාලාවේ ඉදි කිරීම් කටයුතු ආරම්භ නොවීම හේතුවෙන් පැරණි ආපනශාලාව සඳහා පුටු 28 ක් නිකුත් කර ඉතිරි භාණ්ඩ සියල්ල වසර 03 කට ආසන්න කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.

(ඈ) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් හක්ගල උද්භිද උද්‍යානයේ ඉඩම මැනුම් කර අයිතිය පවරා ගෙන නොතිබුණි.

(ඉ) 2019 වර්ෂයේ රු. 143,635 කට මිලදී ගෙන තිබුණු 4'×3'×3' ප්‍රමාණයේ ගේබියන් බොක්ස් 20 ක් වසර 03 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගනේවත්ත වන ඖෂධ උද්‍යානය තුල දේශන, පුහුණු වැඩ සටහන් හා වැඩමුළු පැවැත්වීමේ අරමුණින් 2017 වර්ෂයේ රු. 23,392,342 ක වියදමකින් ඉදිකර තිබුණු දෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ල තුල වසර 6 ක කාලයකදී දේශන 64 ක් පවත්වා ඇති අතර බාහිර පාර්ශවයන්ට කුලියට දීමෙන් රු. 40,500 ක ආදායමක් උපයා තිබුණි. ඒ අනුව විශාල පිරිවැයක් දරා ඉදිකරන ලද ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවැතුණි.

(ආ) රාජකීය උද්භිද උද්‍යානයේ ප්‍රධාන ගේට්ටුව අසල ස්ථාපිත කර ඇති පැළ අලෙවිසැල් භූමියෙහි වර්ග අඩි 900 කට ආසන්න බිම් ප්‍රමාණයක් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව මසකට රු. 6,000 ක මුදලකට සුවහස් මල් වගාකරුවන් සදහා ලබා දී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.4 වගන්තියට අනුව නිවාස අතුරු බදු දිය නොහැකි වුවත් නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලයට අයත් අංක 37/12 දරන රජයේ නිවාසය යුධ සොහොන් ඒකකයට අනුයුක්තව සේවය කරන කම්කරු සේවයේ අයෙකු වෙත 2008 ජුලි 07 දින සිට ලබා දී තිබුණද 2022 අගෝස්තු 30 දින කරන ලද පරීක්ෂාවේදී බාහිර පුද්ගලයෙකු පදිංචි වී ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලය පිහිටි ඉඩම විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොමැති අතර 2022 අගෝස්තු වන විට එම පරිශ්‍රය තුල අනවසර ඉදිකිරීමක් ද සිදු කර තිබුණි.

(ඉ) 1989 පෙබරවාරි 27 දිනැති අංක මදි/4/මල්/04/988 දරන මහනුවර දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය අනුව පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට පැමිණෙන වාහන නැවැත්වීම සඳහා ස්ථානයක් ලෙස රාජකීය උද්භිද උද්‍යානය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ මැද සිට අඩි 50 ක් මාර්ග රක්ෂිතයට වෙන්කර ඉතිරි බිම් කොටස උද්‍යානයට පවරාදී තිබුණි. එම පරිශ්‍රයට අයත් භූමිය තුල බාහිර පුද්ගලයෙකු විසින් වර්ග අඩි 250 ක පමණ ගොඩනැගිල්ලක් ඉදිකර ව්‍යාපාරයක් කරගෙන යමින් පැවතියත් එය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සතු කිරිහල, කැෆටේරියා ආපන ශාලාව සහ සුභසාධන ආපන ශාලාව සමාලෝචිත වර්ෂය තුල රජයේ තක්සේරුවක් ලබා ගැනීමෙන් තොරව කළමනාකරණය විසින් අවම ලංසුව තීරණය කර බදු පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි.

(උ) සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට අයත් අක්කර 08 ක තේ වත්ත ඉකුත් වර්ෂයේ ජනවාරි 29 දින වසර 05 ක කාලයක් සඳහා රජයේ තක්සේරුවක් රහිතව බාහිර පුද්ගලයෙක් වෙත බදු දී තිබුණි. 2022 ජනවාරි 28 දින බදුකරු විසින් ගිවිසුම උල්ලංගනය කිරීම මත ගිවිසුම අවලංගු කර තිබුණද හිගව පැවති රු. 477,002 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ආයතනයට අයත් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

4. **අනුකූලතා වාර්තාව**

සමාලෝචිත වර්ෂයට අදාල ඉදිරිපත් කර තිබුණු කෙටුම්පත් කාර්යසාධන වාර්තාවෙහි පරීක්ෂා කරන ලද 5.1, 12.3 හා 13.1 හි සඳහන් කරුණු ඉටු කර නොතිබියදී එම කාර්යයන් ඉටු කළ බවට "අනුකූල වේ" යනුවෙන් දක්වා තිබුණි.

5. **මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත කාර්යය මණ්ඩලය හා තත්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 10 ක් ද ඇතුළුව පුරප්පාඩු 166 ක්විය.

(ආ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට අනුයුක්තව සිටි තනතුරු 06 කට අයත් නිළධාරීන් 12 දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබුණි. ඉන් තනතුරු 02 කට අයත් නිළධාරීන් 06 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණද දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයට අන්තර් ග්‍රහණය කිරීමකින් තොරව එම නිලධාරීන් වෙනුවෙන් මාසිකව රු.335,596 ක මුදලක් වැටුප් ලෙස ගෙවමින් පැවතුණි.

එච්.ඒ. ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත:- අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 1